දේව ගැත්තෙක් තවත් දේව ගැත්තකුගේ අඩුපාඩු මෙලොවෙහි සඟවන්නේ නම්, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් ඔහුගේ අඩුපාඩු සඟවනු ඇත

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "දේව ගැත්තෙක් තවත් දේව ගැත්තකුගේ අඩුපාඩු මෙලොවෙහි සඟවන්නේ නම්, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ්
ඔහුගේ අඩුපාඩු සඟවනු ඇත." [صحيح] [رواه مسلم]

මුස්ලිම්වරයකු තම සහෝදර මුස්ලිම්වරයාගේ කටයුතු අතරින් යම් කටයුත්තක් සඟවන්නේ නම්, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සර්වබලධාරී අල්ලාහ් ඔහුගේ කටයුතු සඟවනු ඇතැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිළි කළහ. ප්රතිඵල හිමිවනුයේ අදාළ ක්රියා වර්ගයෙන්මය. ඔහුගේ අඩුපාඩු ඔහුගේ පාපකම් මහ්ෂර් දිනයේ ප්රචාරය කිරීමෙන් අල්ලාහ් ඔහු වෙනුවෙන් සඟවනු ඇත. ඇතැම් විට ඒ සඳහා වන විනිශ්චය හා එය ඔහුට මෙනෙහි කර සිටීම පවා අත්හැර දමන්නට පුළුවන.

http://sunnah.global/hadeeth/si/show/3777